# ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

# ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය අදියර II පියවර 2

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය, ගුවන් සේවා කර්මාන්තයේ වර්ධනය වන ඉල්ලුම සපුරාලීමට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පහසුකම් වැඩිදියුණු කිරීම ඉලක්ක කොටගත් වැදගත් සංසිද්ධියක මුල පිරීමකි. ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA) අතිනවීන සහ නූතන පහසුකම්වලින් සමන්විත නව පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වන මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයයි. මෙම ව්‍යාපෘතිය පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම පමණක් නොව යාන්ත්‍රික, විදුලි සහ ජල සම්පාදන (MEP) තොරතුරු තාක්ෂණය, යටිතල පහසුකම් සහ ජපන් ඉංජිනේරුමය උපදේශනය සමග සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් සමග ආශ්‍රිත කර්මාන්තවල සම්පූර්ණ පරාසයම පරිග්‍රහණය කරගනියි.

**මුදල් අමාත්‍යාංශයේ, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 ප්‍රකාරව, කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ඉහත ව්‍යාපෘතිය සඳහා සුදුසුකම්ලත්, ක්‍රියාශීලී ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## ඇබෑර්තු (කොන්ත්‍රාත් පදනම)

## ව්‍යාපෘති අධ්‍යක්ෂ

### ප්‍රධාන වගකීම්

ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ වගකීම වන්නේ සමස්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ සමස්ත සැලසුම්කිරීම, නිර්මාණ සැලැස්ම, සම්බන්ධීකරණය ක්‍රියාත්මක කිරීම, ඉදිකිරීම් අතරතුර සමස්ත සම්බන්ධීකරණය, පරීක්ෂා කිරීම, තත්ත්ව පාලනය, අධීක්ෂණය සහ ව්‍යාපෘතියේ සියලුම ක්‍රියාකාරකම් වාර්තා කිරීම අතුළත් ඵලදායී ව්‍යාපෘති කළමනාකරණය සහතික කිරීමයි.

### අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක්

**සහ**

පිළිගත් ඉංජිනේරු ආයතනයක සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ වලංගු සාමාජිකත්වය

**සමග**

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 07 සමග කළමනාකරණ මට්ටමේ වසර 14ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

බහුජාතික පරිසරයක් (විශේෂයෙන් විදේශ අරමුදල් සහිත) සහිත සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති සහ/ හෝ බහුවිෂයික ඉංජිනේරු ව්‍යාපෘති කළමනාකරණය කිරීමේ වැඩි වසර ගණනක පළපුරුද්ද ඇති සහ කොන්ත්‍රාත් පරිපාලනය සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහිත අපේක්ෂකයින්ට ප්‍රමුඛතාවය හිමි වේ.

### වැටුප් පරාසය

PS 1 මට්ටම රු. 200,000.00 සිට රු. 220,000.00 දක්වා (මාසික වැටුප) සහ රජයේ අනුමත දීමනා

### පොදු කොන්දේසි

වයස් සීමාව අවුරුදු 65ට අඩුවිය යුතුය. (65 ඉහළ සලකා නොබැලේ)

EPF (සේවක අර්ථසාධක අරමුදල) සඳහා සේවකයා තම වැටුපෙන් 8% කින් හා සේව්‍යයා EPF (සේවක අර්ථසාධක අරමුදල) සඳහා 12% කින් සහ ETF (සේවා නියුක්තයන්ගේ භාර අරමුදල) සඳහා 3% කින්ද දායක වනු ඇත.

### රැකියා නියුක්තියේ නියමයන්

සාර්ථක කාර්ය සාධනය සහ ව්‍යාපෘතියේ කාලසීමාවට යටත්ව දීර්ඝ කිරීමේ පහසුකම සහිතව මූලිකව වසර දෙකක කාලයකට කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනේ.

### රැකියා ස්ථානය :

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ,

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,

මිනුවන්ගොඩ පාර, නයිකන්ද, කටුනායක.

### අයදුම්පත් :

සම්පූර්ණ ජීවදත්ත සමග අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර ඇතුළත් අයදුම්පත්, අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කොට 2025 ජූලි 28 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි, ලේකම්, සිවිල් ගුවන් සේවා අංශය, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, 25 වන මහල, බටහිර කුලුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. සහතික පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය.

රාජ්‍ය/ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

**ලේකම්,**
**ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,**
**25 වන මහල, බටහිර කුලුන,**
**ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.**